# මතුගම අධ්‍යාපන කලාපය

## විද්‍යා විෂය ඒකක සංවර්ධන වැඩසටහන

| 6 ශ්‍රේණිය | ශබ්දය හා ඇසීම | ඒකකය - 06 |
|---|---|---|

**01.** ගැලපෙන ලෙස යාකරන්න.

| | | |
|---|---|---|
| i. | හඬ නිපදවන විට සිදුවන ඔබ මොබ චලනය | කන |
| ii. | ධ්වනිය නිපදවන වස්තු | පාසල් සීනු හඬ |
| iii. | ශබ්දය සඳහා සංවේදී වන ඉන්ද්‍රිය | ගිටාරය |
| iv. | ස්වාභාවිකව ඇතිවන ශබ්දයකි. | රබාන |
| v. | කෘත්‍රිමව ඇතිකරන ශබ්දයකි. | කම්පනය |
| vi. | රිද්මයකට අනුව ගැයෙන හෝ වැයෙන ශබ්ද | ධ්වනි ප්‍රභව |
| vii. | තන්තු කම්පනයෙන් ශබ්දය නිපදවයි. | සංගීතය |
| viii. | පටල කම්පනයෙන් ශබ්දය නිපදවයි. | සෙක්සෆෝනය |
| ix. | අවිධිමත් ශබ්ද | කුරුලු නාද |
| x. | වාත කඳක් කම්පනය වන උපකරණයකි. | ඝෝෂා |

(ල. 10)

**02.** පහත සඳහන් ක්‍රියාකාරකම අනුව අසා ඇති පශ්ණ වලට පිළිතුරු සපයන්න.



i. ඊතල මගින් පෙන්වා ඇති කොටස් නම් කරන්න. (ල. 02)

ii. මෙම ක්‍රියාකාරකම කිරීමේ දී දක්නට ලැබෙන නිරීක්ෂණයක් ලියන්න. (ල. 02)

iii. මෙහි දී කම්පනය වන්නේ රබානේ කුමන කොටස ද? (ල. 02)

**iv.** ධ්වනි ප්‍රභව **02** ක් ලියන්න. (ල. 04)

**03.** ඔබ පංති කාමරයේදී ශබ්දය උපදවන භාණ්ඩ කිහිපයක් නිර්මාණය කරන්නට ඇත. එයින්,

**i.** එක් භාණ්ඩයක් වන ටින් වීණාව නිර්මාණය කිරීම සඳහා ඔබට අවශ්‍ය දෑ ලියන්න. (ල. 04)

**ii.** ඔබ නිර්මාණය කළ ටින් වීණාවේ නම් කළ රූප සටහනක් අඳින්න. (ල. 06)

iii. ඔබ දන්නා වාද්‍ය භාණ්ඩ අතුරින් ටින් වීණාවට සමාන වාද්‍ය භාණ්ඩයක නම ලියන්න. (ල. 02)

**iv.** මෙහිදී කම්පනය වන්නේ වාත කඳක් ද? පටලයක් ද? තන්තු ද? (ල. 02)

**04.** පහත ශබ්ද සංගීත සහ ඝෝෂා අනුව වර්ග කරන්න.

වයලින් වාදනය, බටනලා වාදනය, නගරයක රථවාහන ශබ්ද, කර්මාන්ත ශාලාවක ශබ්ද,

වෙළෙඳුන්ගේ කෑ ගසන ශබ්ද, තබ්ලා වාදනය **(ල. 06)**

| සංගීත | ඝෝෂා |
|---|---|
| | |
| | |
| | |

**05.** ගැලපෙන රූප යා කරන්න.





















**(ල. 10)**